සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - 2017

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ සිදුවූ ගනුදෙනු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලන තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව, 2018 සැප්තැම්බර් 19 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම

--

සමාගමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම

සමාගම විසින් අවසන්වරට පිළියෙල කර විගණනය කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වත්කම්	**වටිනාකම්**
	රු.
ජංගම නොවන වත්කම්	2,517,816,106
ජංගම වත්කම්	5,209,490,746

මුළු වත්කම්	7,727,306,852
	===========

බැරකම්

ජංගම බැරකම්	2,397,821,256
ජංගම නොවන බැරකම්	531,113,782

මුළු බැරකම්	2,928,935,038
ශුද්ධ වත්කම්/අයිතිය	4,798,371,814

මුළු බැරකම්	7,727,306,852
	===========
මුළු ආදායම	7,799,193,805
මුළු වියදම	6,926,120,414

අතිරික්තය	873,073,391
	===========

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
2007 අංක 07 දරන සමාගම් පනත	
(i) 131 වගන්තිය	වාර්ෂික වාර්තාවක් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමේ දින සිට වැඩ කරන දින 30 ක් ඇතුළත සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු වුවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.
(ii) 133 වගන්තිය	එක් එක් වර්ෂයකට වරක් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ශේෂ පත්‍ර දිනයේ සිට මාස හයකට වඩා පසු නොවන සහ පූර්ව වාර්ෂික රැස්වීමෙන් පසු මාස පහළොවකට වඩා පසු නොවන දිනක දී කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීමක් කැඳවනු ලැබිය යුතු වුව ද සමාගම විසින් 2014 වසරෙන් පසුව එබඳු රැස්වීමක් පවත්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

2011 අගෝස්තු 11 දිනැති අංක 43 දරන ඌන ක්‍රියාකාරී වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ පිහිටවනු ලැබූ සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ මෙහෙයුම් ඒකක දෙකක් ලෙස පැල්වත්ත සීනි සමාගම සහ සෙවනගල සීනි සමාගම ක්‍රියාත්මක වේ. මෙම සමාගමේ ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෙවනගල සීනි සමාගමට අයත් උක් වගා කළ හැකි මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 4215 ක් වුවද, 2017 වර්ෂය වන විට සමාගමේ උක් වගා කර තිබූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 3504 ක් විය. මේ අනුව කර්මාන්තශාලාවේ මෙහෙයුම් උපරිම ධාරිතාවයෙන් යුක්තව පවත්වාගෙන

යාමට අවශ්‍ය උක් සැපයුම ලබාගැනීමට ප්‍රමාණවත් ඉඩම් සමාගම සතුව තිබුණ ද එම ඉඩම් වගා කර කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහළ දැමීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) සෙවනගල සීනි සමාගමේ 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වර්ෂ 06 ක කාලය සලකා බැලීමේදී 2016 දී හෙක්ටයාරයකට උක් එලදාව මෙට්‍රික්ටොන් 86 ක් වුවද, 2017 වන විට මෙට්‍රික්ටොන් 69 දක්වා අඩු වී තිබුණ ද මෙම තත්ත්වය වර්ධනය කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රවාහනය සඳහා වැඩි කාලයක් ගත වීමෙන්, කම්හල් ආපදා, උක් දඬුවල පවතින රොඩු හා අපද්‍රව්‍ය හේතුවෙන් සීනි නිපදවීමට යොදා ගන්නා උක් දඬුවල පවතින සීනි ප්‍රමාණය 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය වන විට පිළිවෙලින් පැල්වත්ත සීනි සමාගමේ උක් මෙට්‍රික් ටොන් එකකට සියයට 11.23 සිට සියයට 7.95 දක්වා ද, සෙවනගල සීනි සමාගමේ සියයට 7.95 සිට සියයට 7.62 දක්වා ද අඩු වී තිබුණි. එසේම එම උක් දඬුවල සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය වන විට පැල්වත්ත සීනි සමාගමේ පිළිවෙලින් සියයට 8.95 සිට 7.3 දක්වා ද, සෙවනගල සීනි සමාගමේ පිළිවෙලින් සියයට 8.01 සිට සියයට 7.67 දක්වා ද අඩු වී තිබුණි. එසේ වුවද මෙම තත්ත්වයන් මඟහරවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඈ) උක් සැපයුම අඩු වීම හේතුවෙන් සමාගමේ උපරිම යන්ත්‍ර ධාරිතාවය වන උක් මෙට්‍රික් ටොන් 837,500 කින් සියයට 35% ක්ම සමාලෝචිත වර්ෂයේදී භාවිතයට ගත නොහැකි වී තිබුණි. එබැවින් සමාගමේ සීනි නිෂ්පාදනය පෙර වර්ෂයේදී මෙට්‍රික් ටොන් 51,422 ක් වුවද, සමාලෝචිත වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 42,841 ක් දක්වා සියයට 17 කින් අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සීනි නිෂ්පාදනය පහළ යාම නිසා එතනෝල් නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍ය වන මොලැසස් නිෂ්පාදනය අඩු වී තිබුණු අතර එතනෝල් විකිණුම් ප්‍රමාණය අඩු වී තිබීමෙන් ස්ප්‍රීතු ගබඩා ටැංකි වැඩි කාලයක් පිරී පැවතීම නිසා නිෂ්පාදනය කල එතනෝල් ස්ප්‍රීතු ගබඩා කිරීමේ ගැටළු ඇති වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව එතනෝල් නිෂ්පාදනය බල්ක් ලීටර් 11,917,279 සිට 7,045,228 දක්වා සියයට 41 කින් අඩු වී තිබුණද, මෙම තත්ත්වය මඟහරවා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඊ) සීනි නිෂ්පාදනය අඩු වීමෙන් එයින් ඉවතලන බැගැස් ආධාරයෙන් නිපද වූ බලශක්තිය පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය වන විට මෙගාවොට් පැය 16,346 සිට 12,534 දක්වා අඩු වී තිබු බැවින් සමාලෝචිත වර්ෂයේදී විකල්ප බලශක්ති සඳහා අමතර පිරිවැයක් දැරීමට සමාගමට සිදු වුවද, මෙම තත්ත්වය කළමනාකරණය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(උ) ඉඩම් සංවර්ධන අංශය සතු ට්‍රැක්ටර් රථ 43 කින්, ට්‍රැක්ටර් රථ 29 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදී අළුත්වැඩියා කටයුතු සඳහා කෘෂිකාර්මික වැඩපල තුළ මාස 06 කට වැඩි කාලයක් රඳවා තැබීමෙන් නිෂ්පාදන කටයුතු අඩපණ වී තිබුණද, එම ට්‍රැක්ටර් රථ කඩිනමින් අළුත්වැඩියා කර ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඖ) වගා බිම් සකස් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ කලට වේලාවට සැපයීමට කළමනාකරණය කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයේ ඉඩම් සංවර්ධන අංශය විසින් ගණනය කර තිබූ පරිදි සමාගමට අහිමි වූ ආදායම හෙක්ටයාරයකට රු.409,950 ක් විය.

(ඓ) උක් අස්වනු නෙලීම සඳහා ක්ෂේත්‍ර තෝරා ගැනීමේ දී, එක් එක් ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා උක් සාම්පල කර්මාන්තශාලා විද්‍යාගාර වෙත යවා සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය සම්බන්ධයෙන් ලබාදෙන නිරීක්ෂණ පදනම් කර ගනිමින් උක් අස්වැනු නෙලීම සමාගමේ සම්ප්‍රදායික ක්‍රමවේදය වූවද, පැල්වත්ත සීනි සමාගමේ 2017 මහ කන්නයේ උක් අස්වනු නෙලීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමෙහි හිටපු වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා විසින් එම සාම්ප්‍රදායික ක්‍රමවේදය අත්හිටුවා තිබුණි. ඒ අනුව ආදායම් අහිමි වීම රු.159,559,000 ක් ලෙස කේන්ද්‍රීය වතු අංශයේ කළමණාකරු විසින් සහතික කර තිබුණි.

(ඒ) වසර 30 කට වඩා පැරණි පැල්වත්ත සීනි සමාගම අඛණ්ඩව මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා එකී නඩත්තු කටයුතු කලට වේලාවට සිදු කිරීමේ අරමුණින් ඉල්ලුම් කරන ලද උපකරණ, මිලට ගැනුම් අංශය විසින් ප්‍රමාද වී මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් 2018 මාර්තු 31 දිනට පෙර අවසන් කළ යුතු නඩත්තු කටයුතු 2018 අප්‍රේල් මාසය අවසානය දක්වා අවසන් කර නොතිබීම නිසා මාසයකින් උක් ඇඹරීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි සමාගමේ විමර්ශන අංශය වෙත සමාලෝචිත වර්ෂයේදී වාර්තාවී ඇති මුළු විමර්ශන 104 කින් විමර්ශන කටයුතු අවසන් කර තිබුණේ සිදුවීම් 36 ක පමණි. ප්‍රමාණවත් විමර්ශන නිලධාරීන් බඳවාගෙන මෙම තත්ත්වය කළමනාකරණය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාර්තා වූ සමාගමේ නඩු වලට අදාළව තොරතුරු හෝ කිසිදු ලිපිගොනුවක් නීති අංශයේ නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී බඳවා ගත් නිළධාරියා වෙත ඔහුගේ රාජකාරී නිසි පරිදි පවරා නීති අංශය විධිමත්ව සංවිධානය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) සෙවනගල සීනි සමාගමේ කාබන්ඩයොක්සයිඩ් නිපදවීමේ ව්‍යාපෘතිය පෞද්ගලික සමාගමක් වෙත 2014 වර්ෂයේදී පවරා ඇති අතර ඒ සඳහා අවශ්‍ය භූමිය, විදුලිය, ජලය හා අනෙකුත් යටිතල පහසුකම් නොමිලේ සීනි සමාගම විසින් ලබා දී තිබුණි. එසේ වුවද, කාබන්ඩයොක්සයිඩ් කිලෝවක් සඳහා රු.25 ක් වැනි අඩු මිලක් සීනි සමාගම වෙත ගෙවා තිබුණි. ඒ අනුව සමාගමේ සම්පත් භාවිතයෙන් පෞද්ගලික සමාගමකට වසර 20 ක් දක්වා ලාභ ලබා ගැනීමට සමාගම අවස්ථාව සලසා දී තිබූ අතර එම මිල සංශෝධනය කර සමාගමේ ආදායම වැඩිකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඈ) සෙවනගල සීනි සමාගමේ අපජලය පිරිපහදු කිරීමට අදාළ යන්ත්‍ර සවිකිරීම සඳහා රු.27,067,812 ක කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබූ අතර, එය 2014 මැයි මාසය වන විට නිම

කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය නිම කිරීමට කළමනාකරණය කටයුතු නොකිරීම හේතුවෙන් කර්මාන්තශාලාව ලබාගත යුතු පරිසර ආරක්ෂණ බලපත්‍රය ද ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.479,808 ක වටිනාකමකට මිලට ගෙන තිබූ ඉන්ධන නිකුත් කිරීමේ යන්ත්‍රය (fuel dispensing pump – electric) මගින් ඉන්ධන නිකුත් කිරීමේදී නිකුත් කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් නිකුත් වන හෙයින් 2018 ජනවාරි 23 දිනට ඩීසල් ලීටර 409 ක අතිරික්තයක් පැවතුණි. මිලට ගෙන වසරක් ගත වීමට පෙර අළුත්වැඩියා කර දීමට හෝ නව ඉන්ධන සැපයුම් යන්ත්‍රයක් ලබාදීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඊ) සෙවනගල සීනි සමාගමේ ප්‍රධාන ගබඩාවේ පැවති ඔක්සිජන් සිලින්ඩර් 66 න් සිලින්ඩර් 22 ක් අස්ථානගත වී තිබූ අතර ඒ පිළිබඳව පරීක්ෂණ සිදුකර වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(උ) සෙවනගල සීනි සමාගමේ ප්‍රධාන ගබඩාවේ ඇසිටිලින් සිලින්ඩර 10 ක් අතිරික්තව පැවතුණි. සමාගම විසින් ගබඩා පොත්පත් නඩත්තු නොකිරීම නිසා මෙම අක්‍රමිකතා සිදුව තිබූ නමුත් මෙම තත්ත්වය කළමනාකරණය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඌ) සෙවනගල සීනි සමාගමේ දුර්වල අභ්‍යන්තර පාලන ක්‍රමවේද හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ඇසිටිලින් සිලින්ඩර 26 ක පැවති ඇසිටිලින් වායුව අස්ථානගත වීම හේතුවෙන් සමාගමට සිදුව ඇති පාඩුව රු. 78,185 කි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(එ) සාංගමික පාලන මාර්ගෝපදේශය “ උපලේඛනය G ” මගින් සමාගමේ ලේකම්ගේ කාර්යභාරය ලෙස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ කටයුතු, වාර්තා පවත්වා ගැනීම ආදිය පිළිබඳ කටයුතු විස්තර කර ඇත. එසේ වුවද, සමාගමේ ලේකම්වරයා වෙත එම රාජකාරී පවරා නොතිබූ අතර එම කටයුතු ඉටු කරවා ගැනීමට වෙනත් නිළධාරියකු යොදවා තිබුණි.

3.3 නිෂ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්

2013 වර්ෂයේදී රු.128,910,000 ක වටිනාකමකට කල්බදු පහසුකම් යටතේ මිලටගත් ක්‍රේන් යන්ත්‍රය සැපයුම්කරු විසින් සීනි සමාගම සමඟ එකඟ වූ පරිදි කර්මාන්තායතනය තුළ ස්ථාපිත නොකිරීම නිසා මිලට ගත් දිනයේ සිට කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. මෙම යන්ත්‍රය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ගෙවා ඇති කල්බදු වාරිකවල වටිනාකම සහ පොලිය රු.21,734,748 ක් වූ අතර, තවදුරටත් ඉදිරි වසර 02 ක් දක්වා පොලිය සහිතව ගෙවිය යුතු මුළු වාරික මුදල රු.27,168,660 ක් බැවින් මෙය නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය

3.4 කාර්යමණ්ඩල පරිපාලනය

සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර කාර්යය මණ්ඩලයක් නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 8 දෙනෙකු කෙටිකාලීන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන එම පත්වීම් නැවත දීර්ඝ කර තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 විගණන කමිටු

සමාගම විසින් විගණන කමිටුවක් පත් කර තිබියදීත් එම කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම හා වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම් ආදී කටයුතුවලදී අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් මඟ පෙන්වීමක් ලබාදී නොතිබුණු බැවින් එම කටයුතු කලට වේලාවට ඉටුවී නොතිබුණි.

4.2 පරිසර විගණනය

කර්මාන්ත ශාලාවෙන් පිටවන අප ජලය පිරිපහදු කිරීමේ ඒකකය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර නොතිබූ අතර එම අප ජලය පරිසරයට මුදාහැරීමෙන් සිදුවන පරිසර හානිය අවම කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

4.3 නොවිසඳී ඇති විගණන ඡේද

2016 විගණකාධිපති වාර්තාවේ 4.1(අ) (i) ඡේදය පරිදි රු.28,163,089 ක වියදමක් දරා නවීකරණය කරන ලද සමාජ ශාලාව හා ආගන්තුක නිවසට දැරූ පිරිවැයට සරිලන ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්‍ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව සමාගමේ සභාපති වෙත වරින්වර අවධානය යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්‍ෂණ
(අ)	මානව සම්පත් කළමනාකරණය	අනුමත බඳවාගැනීමේ පරිපාටියක් සකස් කර නිශ්චිත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
(ආ)	ප්‍රසම්පාදන පාලනය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.